“කිසිවකු හෝ මා වෙත සලාම් පවසන්නේ ද ඔහුට මා පිළිතුරු වශයෙන් සලාම් පවසන තෙක් අල්ලාහ් මාගේ ප්රාණය මට ලබා දෙනු ඇත.”

සැබැවින්ම අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව
අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “කිසිවකු හෝ
මා වෙත සලාම් පවසන්නේ ද ඔහුට මා පිළිතුරු වශයෙන් සලාම් පවසන තෙක් අල්ලාහ් මාගේ ප්රාණය මට ලබා දෙනු ඇත.”
[إسناده حسن] [رواه أبو داود وأحمد]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත කවරෙකු සලාම් පවසා සිටියේ ද, ඔහු ළඟ සිටියද දුර සිටියද ඒ සෑම කෙනෙකුටම එතුමාණන් සලාම් පවසන තෙක් එතුමාණන්ගේ ප්රාණය එතුමාණන් වෙත නැවත ප්රදානය කරනු ලබන බව එතුමාණෝ දන්වා සිටියහ. බර්සක් හා කබ්ර් (මිනීවල) ජීවිතය යනු ගුප්ත කරුණකි. එහි යථාර්ථය අල්ලාහ් හැර වෙනත් කිසිවකු නොදනී. ඔහු සෑම දෙයක් කෙරෙහිම සර්වබලධාරීය.

https://sunnah.global/hadeeth/si/show/6222